සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, තුන්වන වාර පරීක්ෂණය - 2025
**General Certificate of Education (Adv. Level), Grade 13, Final Term Test - 2025**

කෘෂි විද්‍යාව I
**Agricultural Science I**

08 S 1

පැය දෙකයි

නම:.......................................................................................................................................................

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

1. 1960 දශකය අගභාගයේ සිදු වූ හරිත විප්ලවය කෘෂි ක්ෂේත්‍රයේ වෙනස්කම් රාශියකට හේතු වුණි. එහි යහපත් ප්‍රතිඵල දැක්වෙන ප්‍රකාශ වනුයේ ,
   A - උසස් අස්වනු දෙන බෝග ප්‍රභේද බිහිවීම. B - භූමි හායනය වේගවත් වීම.
   C - ස්වභාවික ප්‍රතිරෝධීතාව පිරිහීම. D - අඩු ශ්‍රමයකින් වැඩ කිරීම.
   1. A පමණි. 2. B හා C පමණි. 3. A හා D පමණි.
   4. B හා D පමණි. 5. A, B හා C පමණි.

2. පහත බෝගයන්ට අදාල වන පර්යේෂණ ආයතන පිහිටි ස්ථානයන්හි නිවැරදි අනුපිළිවෙල වනුයේ,

| | **බෝගය** | | **පිහිටා ඇති ස්ථානය** |
|---|---|---|---|
| A | මිරිස් | a. | කඹුරුපිටිය |
| B | කුරුඳු | b. | මාතලේ |
| C | උක් | c. | අගුණකොළපැලැස්ස |
| D | එනසාල් | d. | හොරණ |
| E | අන්නාසි | e. | උඩවලව |

   1. a,c,b,d,e 2. e,c,a,d,b 3. c,a,e,b,d
   4. b,c,d,e,a 5. d,b,a,e,c

3. පහත සඳහන් දේශගුණික පරාමිතීන් මැනීමට යොදාගන්නා උපකරණ හා ඒකක නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ,
   1. ආලෝක කාලසීමාව - සූර්ය විකිරණ මානය - වර්ග මීටරයට වොට් ( $wm^2$ )
   2. වාෂ්පීකරණය - වාෂ්පීකරණ තැටිය - සෙන්ටිමීටර (cm)
   3. සුළගේ දිශාව - සුළං දිශා දර්ශකය - මිනිත්තුවට කිලෝමීටර (km/min)
   4. සාපේක්ෂ ආර්ද්‍රතාවය - තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය - ප්‍රතිශතය (%)
   5. ආලෝක තීව්‍රතාවය - සූර්ය දීප්තමානය - පැය (hours)

4. ශාකවල පුෂ්පීකරණය උත්තේජනයට බලපාන හෝර්මෝනය වන්නේ,
   1. පයිටක්‍රෝම් 2. සයිටොකයනීන් 3. ෆ්ලෝරිජීන්
   4. ක්ලෝරොෆිල් 5. කාබොක්සිලේස්

5. පසක භෂ්ම සංතෘප්තිය පසෙහි රසායනික ගුණාංග පිළිඹිබු කරයි. පසක භෂ්ම සංතෘප්තතා ප්‍රතිශතය 30% නම්, එම පස,
   1. සාරවත් පසකි. 2. බෝගවලට අත්‍යවශ්‍ය මහා පෝෂක බහුලය.
   3. ඇලුමිනියම් හා හයිඩ්‍රජන් අයන අඩුය. 4. ආම්ලික පසකි.
   5. පෝෂක සුලභතාව ඉහළය.



Click & Visit Our Site
ALapiedu.com

6. පාංශු ඛනිජ පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - පාංශු වයනය කෙරෙහි ඛනිජ බලපායි.
B - 2:1 අනුපාතය ඇති මැටි ඛනිජ මැනවින් ජලය උරාගනී.
C - විෂමජාතිය අකාබනික ද්‍රව්‍ය වේ.
මින් වඩාත් නිවැරදි වන්නේ,
1. A පමණි. 2. B පමණි. 3. A හා B පමණි.
4. B හා C පමණි. 5. A ,B හා C යන සියල්ලම.

පහත වයන ත්‍රිකෝණය උපයෝගී කර ගන්න.




| | |
|---|---|
| Clay | - මැටි |
| Sandy clay | - වැලිලෝම |
| Sandy clay loam | - වැලි මැටි ලෝම |
| Sandy loam | - වැලි ලෝම |
| Loamy sand | - ලෝම වැලි |
| Sand | - වැලි |
| Clay loam | - මැටි ලෝම |
| Loam | - ලෝම |
| Salty clay | - රොන්මඩ මැටි |
| Salty clay loam | - රොන්මඩ මැටි ලෝම |
| Silt loam | - රොන්මඩ ලෝම |
| Silt | - රොන්මඩ |

7. මැටි 35% , රොන්මඩ 52% , වැලි 13% වූ පාංශු නියැදියක වයන පන්තිය වූයේ,
1. වැලිමය මැටි ලෝම පසකි. 2. රොන්මඩ මැටි ලෝම පසකි. 3. වැලිමය මැටි පසකි.
4. ලෝම වැලි පසකි. 5. රොන්මඩ ලෝම පසකි.

8. විද්‍යාගාරය තුලදී පාංශු තෙතමනය නිර්ණය කල හැකි ක්‍රමයක් වන්නේ,
1. ජිප්සම් කුට්ටි ක්‍රමය. 2. ක්ෂේත්‍ර ආතතිමාන ක්‍රමය. 3. භාරමිතික ක්‍රමය.
4. සවිවර කුට්ටි ක්‍රමය. 5. ද්‍රවමාන ක්‍රමය.

9. “සම්පූර්ණ පොහොර” ලෙස හඳුන්වන පොහොර මිශ්‍රණයක අඩංගු මහා පෝෂක තුන වන්නේ,
1. N , P , Ca 2. N , K , P 3. P , K , S
4. Ca , Mg , S 5. ඉහත සියල්ලම.

10. පොස්පරස් වලතාව වැඩිකරන ජෛව පොහොර සෑදීමට භාවිතා කරන ක්ෂුද්‍ර ජීවියා වන්නේ,
1. Bacillus 2. Pseudomonas 3. Aspergillus
4. Mycorrhizal 5. Penicillium

11. පාංශු ආකලන පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - පාංශු ව්‍යුහය හා වයනය දියුණු කිරීම සඳහා පසට ආකලන ද්‍රව්‍ය එකතු කරයි.
B - පාංශු ආකලන මගින් පසෙහි රඳවාගත හැකි පෝෂක ප්‍රමාණය වැඩි වී ශාක ඌනතා ලක්ෂණ මඟ හරියි.
1. A සත්‍ය වේ. B සත්‍ය වේ. A මගින් B පැහැදිලි කරයි.
2. A සත්‍ය වේ. B සත්‍ය වේ. A මගින් B පැහැදිලි නොකරයි.
3. A සත්‍ය වේ. B අසත්‍ය වේ.
4. A අසත්‍ය වේ. B සත්‍ය වේ.
5.A හා B වගන්ති දෙකම අසත්‍ය වේ.



AL අපි
Click & Visit Our Site
ALapiedu.com

12. මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර දෙක වන්නේ,
   1. ප්‍රාථමික බිම් සැකසීම හා පාත්ති දැමීමය.
   2. ප්‍රාථමික බිම් සැකසීම හා අතුරුයත් ගෑමය.
   3. ප්‍රාථමික බිම් සැකසීම හා ද්විතියික බිම් සැකසීම ය.
   4. ද්විතියික බිම් සැකසීම හා මට්ටම් කිරීමය.
   5. ද්විතියික බිම් සැකසීම හා පාත්ති දැමීමය.

13. 

   මෙම උපකරණය භාවිත කරන බිම් සැකසීමේ අවස්ථාව වනුයේ,
   1. ප්‍රාථමික බිම් සැකසීමේ දී ය.
   2. ශූන්‍ය බිම් සැකසීමේ දී ය.
   3. අවම බිම් සැකසීමේ දී ය.
   4. ද්විතියික බිම් සැකසීමේ දී ය.
   5. යටි පස බුරුල් කිරීමේ දී ය.

14. බඩ ඉරිඟු බෝගය සඳහා පහත ලබාදී ඇති දත්ත ඇසුරින් ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාවය ගණනය කරන්න.

   බෝගයේ මූල පද්ධතියේ ගැඹුර = 80cm
   පසේ දෘශ්‍ය ඝනත්වය = 1.6 $g/cm^3$
   ජලය සපයන විට පසේ තෙතමන ප්‍රතිශතය = 10%
   ක්ෂේත්‍ර ධාරිතාවේ දී පසේ තෙතමන ප්‍රතිශතය = 20%

   1. 8cm
   2. 12.8cm
   3. 16.2cm
   4. 20cm
   5. 25.6cm

15. ආටිසියානු ළිං පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
   1. බොහෝවිට උණුසුම් ලවණ මිශ්‍ර වූ ජලය පවතින නිසා බෝග වලට හානිවේ.
   2. වියළි කලාපයේ හා තෙත් කලාපයේ උස්බිම් වලට ජලය ලබා ගනී.
   3. සුළු පරිමාණ ගොවිපලවල් සඳහා බහුලව භාවිත වේ.
   4. අපාරගම්‍ය ස්ථරයක් මත අධික පීඩනයකින් ජලය සංචිතව පවතී.
   5. කඳුකර ජලාධාරා ප්‍රදේශවල ජල සංචායකයේ පෝෂිත ප්‍රදේශ පවතී.

16. බීජ හා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. මේවා අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
   1. බීජයක ඇති කළලය බීජ මූලය, බීජෝපරිය, බීජ පත්‍ර හා භ්‍රෑණපෝෂණ යන කොටස් වලින් සමන්විත වේ.
   2. පරිණත ඒක බීජ පත්‍රී බීජයක භ්‍රෑණපෝෂය කැපී පෙනෙන මුත් ද්වි බීජ පත්‍රී බීජයක එය ක්ෂිණ වී ඇත.
   3. ද්වි බීජ පත්‍රී බීජයක බීජ පත්‍ර කැපී පෙනෙන මුත් කළලයට ආහාර සැපයීමේ කාර්යය භ්‍රෑණපෝෂය මගින් සිදු කෙරේ.
   4. ඒක බීජ පත්‍රී බීජයක බීජාවරණය හා ඵලාවරණය වෙන් ව දක්නට ලැබේ.
   5. බොහෝ ඒක බීජ පත්‍රී ඵල තුළ බීජ කිහිපයක් පවතින මුත් ද්වි බීජ පත්‍රී ඵල තුළ බීජ රැසක් පවතී.

17. බීජවල භෞතික පාරිශුද්ධතාව සෙවීමේ දී, ශුද්ධ බීජ ලෙස සළකනු ලබන්නේ,
   1. රෝගී බීජ
   2. අපරිණත බීජ
   3. වල් බීජ
   4. කුඩා ලෙස කැඩුණු බීජ
   5. හිස් පුෂ්පිකා

18. කිසියම් බීජ නියැදියක ආරම්භක බර ග්‍රෑම් x වේ. එම බීජ නියැදිය සම්පූර්ණ ලෙස වියළීමට බඳුන් කළ විට එහි බර ග්‍රෑම් Y වේ.එම බීජ නියදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ,

   1. $\frac{(y-x)}{Y} \times 100$
   2. $\frac{(x-y)}{y} \times 100$
   3. $\frac{(x-y)}{x} \times 100$
   4. $\frac{(y-x)}{X} \times 100$
   5. $\frac{y}{X} \times 100$



AL අපි
Click & Visit Our Site
ALapiedu.com

19. යම් ශාක කොටසක් කැම්බියම තෙක් යෙදූ කැපුම නිසා අවට සෛල වල C:N අනුපාතය හා හෝමෝන සාන්ද්‍රනය වැඩි වී ඒ අවට විශේෂණය නොවූ සෛල පස හා ජලය ගැටීම නිසා අවශෝෂණ කෘත්‍ය ඉටු කිරීමේ ව්‍යුහයක් බවට පත්වේ. මේ විද්‍යාත්මක මුලධර්මය උපයෝගී කර ගන්නා ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,

1. බද්ධ කිරීම යි.
2. ලේයර් කිරීම යි.
3. අතු පැළ කිරීමේ දී ය.
4. පත්‍ර කැබලි පැළ කිරීමේ දී ය.
5. මුල් කැබලි පැළ කිරීමේදී ය.

20. වෛරස් ආසාදිත මව් ශාකයකින් නිරෝගී පැළ ලබාගැනීමට වඩාත් සුදුසු ශාක ප්‍රචාරණ ක්‍රමය වනුයේ,

1. බද්ධ කිරීමයි.
2. ලේයර් කිරීමෙනි.
3. ක්ෂුද්‍ර ප්‍රචාරණයෙනි.
4. අත්තක් පැළ කිරිමෙනි.
5. පත්‍ර මගින් පැළ ලබා ගැනීමෙනි.

21. GM ආහාර නිෂ්පාදනයේ දී යොදාගනු ලබන තාක්ෂණය වනුයේ,

1. නුමුහුන් පෙළ වරණය යි.
2. දෙමුහුම් අභිජනනය යි.
3. විකෘති අභිජනනය යි.
4. ජාන තාක්ෂණය යි.
5. සමූහ වරණය යි.

22. නිර්පාංශු වගාවේ දී ඝන මාධ්‍ය තුල සිදු කරන වගා ආකාරයක් වන්නේ,

1. මුල් ගිල්වූ වගාව
2. කේශික අවශෝෂණ වගාව
3. වගා මළු තුළ වගාව
4. ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය
5. පෝෂක ද්‍රාවණ පටල තාක්ෂණය.

23. ජෛව විද්‍යාත්මක පළිබෝධ කළමනාකරණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ජෛව පාලන කාරකයන් ලෙස පරපෝෂිතයන්, විලෝපිකයන් හා ව්‍යාධිජනකයින් යොදා ගනියි.
B - වෙනත් පරපෝෂිතයන්ගෙන් හා විලෝපිකයන්ගෙන් ජෛව පාලන කාරකයන් නිදහස් විය යුතුය.
C - ජීවීන්ගේ හෝමෝන ද පළිබෝධ කළමනාකරණය සඳහා යොදා ගැනේ.

මෙහිදී සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A හා B පමණි.
5. B හා C පමණි.

24. පළිබෝධ ගහන විචලතා සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. මින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

A - ජීවී ගහන ඝනත්වය ආර්ථිකව හානියක් සිදු කළ හැකි මට්ටමට පැමිණි විට එම තත්ත්වය වසංගත තත්වයක් ලෙස සලකයි.
B - යම් වගාවක ආර්ථික හානිදායි මට්ටමේ දී පළිබෝධ පාලනය කිරීමට වැයවන වියදම, එම පළිබෝධකගේ හානිය නිසා සිදුවන අලාභයට වඩා වැඩිය.
C- පළිබෝධ පාලන ක්‍රම ඇරඹිය යුතු උපරිම ගහන ඝනත්වය ආර්ථික දේහලීය මට්ටම වේ.

1. A පමණි
2. B පමණි
3. C පමණි
4. A හා B පමණි
5. B හා C පමණි

25. මයිටා හානියට ලක් වූ බෝග වගා ක්ෂේත්‍රයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

1. පුෂ්ප හා ඵල කොටස් ආහාරයට ගැනීම.
2. පත්‍ර දාරය යටි අතට හැකිළීම.
3. ශාක මතුපිට පමණක් සුරා තිබීම.
3. කඳ සිදුරුකර අභ්‍යන්තර කොටස් කා දැමීම.
5. පත්‍ර කොටස් කා දැමීම හෝ කපා දැමීම.

26. පහත සඳහන් කෘමි ගෝත්‍ර අතරින් හපන හා චිකන මුඛ උපාංග දරන අසම්පූර්ණ රූපාන්තරණයක් ඇති, පූර්ව පියාපත් යුගළ ඒකාකාරව ඝන වූ (tagmina) ගෝත්‍රය වනුයේ,

1. තයිසනොප්ටෙරා
2. අයිසොප්ටෙරා
3. ඕතොප්ටෙරා
4. හෝමොප්ටෙරා
5. හෙමිප්ටෙරා



Click & Visit Our Site
ALapiedu.com

27. ශාක කිහිපයක දක්නට ලැබුනු විවිධ රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - මෘදු කුණු වීම. B - ප්‍රාදේශික පුල්ලි ඇති වීම. C - විචිත්‍රය ඇත.
D - කුඩා ඵල හා පත්‍ර E - ශාක මැලවීම.

ඉහත ලක්ෂණ අතුරින් ELIZA පරීක්ෂණයට භාජනය කිරීමෙන් හඳුනාගත හැකි රෝග කාරකයාට ගැලපෙන රෝග ලක්ෂණය වන්නේ,

1. A 2. B 3. C 4. D 5. E

28. ශාකයක $K^+$ මගින් සිදුකෙරෙන කාර්යයක් වන්නේ,

1. ප්ලෝයමීය පරිසංක්‍රමණය 2. පූටිකා චලනය 3. ශ්වසනය
4. ප්‍රභසංශ්ලේෂණය 5. වර්ණක සංශ්ලේෂණය

29. පුද්ගලයකු පෙන්නුම් කරන ලද සෞඛ්‍ය ගැටලු කිහිපයක් පහත දැක්වේ.

A - දියවැඩියාවට ගොදුරුවීමේ හැකියාව ඇත.
B - ආර්තව වෙනස්කම් ඇති වේ.
C - කිරීටක හෘද රෝග තත්ත්ව ඇති වේ.

ඉහත ප්‍රකාශ අතුරින් ශරීර ස්කන්ධ දර්ශකය 30 ඉක්මවූ පුද්ගලයකුට අදාල වන්නේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි. 4. A හා B පමණි. 5. A,B,C සියල්ලය.

30. ආහාර කර්මාන්තයේ දී වැදගත් වන ප්‍රමිතීන් අතුරින් ආහාරයකට ගොවිබිමේ සිට කර්මාන්ත ශාලාව දක්වා අහිතකර ද්‍රව්‍ය එකතුවීම වැළැක්වීමට අදාල වන පද්ධති ප්‍රමිතිය වන්නේ,

1. HACCP 2. GMP 3. GAP 4.SLS 5. ISO

31. අස්වනුවල පරිණතබව නිර්ණය කිරීමට යොදා ගන්නා රසායනික සාධකයක් වන්නේ,

1. විශිෂ්ට ගුරුත්වය 2. තෙල් ප්‍රමාණය 3. එතිලීන් ප්‍රමාණය
4. ශ්වසන වේගය 5. අස්වැන්නේ වයස

32. පහත දක්වා ඇත්තේ පලතුරු ඉදීමේදි කාලයත් සමග ශ්වසන වේගය වෙනස්වන ආකාරය පෙන්වන ප්‍රස්තාරයක රූප සටහනයි.




මින් පෙන්වනුයේ,

1. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: අන්නාසි
2. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: ඇපල්
3. අන්ත උපරිමය නොපෙන්වන පළතුරු වේ. උදා: අන්නාසි
4. අන්ත උපරිමය පෙන්වන පළතුරු වේ. උදා: මිදි
5 .අන්ත උපරිමය නොපෙන්වන පළතුරු වේ. උදා: පෙයාර්ස්

33.අධික උෂ්ණත්වය හේතුවෙන් ගොවිපළ සතුන්ගේ සිදුවිය හැකි කායික වෙනසක් නොවන්නේ,

1. දෙනුන්ගේ මද කාලය අඩුවීම හා මද ලක්ෂණ පැහැදිලි නොවීම.
2. සතුන්ගේ ඛේට ස්‍රාවය වැඩි වේ.
3. සතුන් ගන්නා ආහාර ප්‍රමාණය වැඩි වේ.
4. නිෂ්පාදන අඩු වේ.
5. සතුන්ගේ සඵලතාව අඩු වේ.



Click & Visit Our Site
ALapiedu.com

34. කුකුළාගේ ජීර්ණ පද්ධතියේ පූර්ව ආමාශය මගින්,
1. HCl හා ඇමයිලේස් ස්‍රාවය වේ.
2. ට්‍රිප්සින් හා ඇමයිලේස් ස්‍රාවය වීම සිදු වේ.
3. HCl හා පෙප්සීන් ස්‍රාවය වීම සිදු වේ.
4. මෝල්ටෝස් හා පෙප්සීන් ස්‍රාවය වීම සිදු වේ.
5. HCl හා ට්‍රිප්සීන් ස්‍රාවය වීම සිදු වේ.

35. වැඩුණු ගවයෙකුගේ මුඛය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. යටි හනුවේ කෘන්තක දත් නොමැති අතර උඩු හනුවේ ඇත.
2. මුඛයේ ඛේට ග්‍රන්ථි නොපිහිටන අතර වමාරා කෑම සිදු වේ.
3. චලනය කළ හැකි තොල් වලින් හා සවිමත් පේෂි වලින් යුක්ත වේ.
4. අස්ථිමය වැටි සහිත විශාල චාර්වක දත් හනු දෙකෙහිම පිහිටයි.
5. රළු කොරොස් දිවක් පිහිටන අතර ශ්ලේෂමල පටල අඩංගු නොවේ.

36. වැඩුණු ගවයෙකුගේ සංකීර්ණ ආමාශය පිළිබඳව නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ,
A. කුඩාම කොටස වන බහුනැමියෙහි අභ්‍යන්තරය පොතක පිටු ආකාරයෙන් පිහිටා ඇත.
B. විශාලතම කොටස වන රූමනයේ ජීර්ණ එන්සයිම නිපදවන ග්‍රන්ථි නොපිහිටයි.
C. ග්‍රන්ථිමය ස්වභාවයක් ගන්නා ජඨරාශය මගින් ඛනිජ ප්‍රතිශෝෂණය කෙරේ.
D. විතංශිකාවේ අභ්‍යන්තර බිත්තියේ ෂඩස්‍රාකාර ව්‍යුහයන් පිහිටා ඇත.

1. A පමණි
2. B පමණි.
3. A හා C පමණි.
4. B හා D පමණි.
5. A, B හා C පමණි.

37. කිරි දෙවීමේදී එළදෙන උත්තේජනය කර මිනිත්තු 6-8ක් තුළ කිරි දෙවීම අවසන් කළ යුතු වන්නේ,
1. ඔක්සිටොසීන් හෝමෝනයේ ක්‍රියාකාරිත්වය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
2. කිරි ස්‍රාවය සඳහා වැදගත් වන ප්‍රෝලැක්ටින්වල ක්‍රියාකාරිත්වය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
3. ඇඩ්‍රිනලීන් හෝමෝන ස්‍රාවය මිනිත්තු 6-8ක් තුළ අවසන් වන බැවිනි.
4. වැඩි කාලයක් ගත වීමේදී කිරි නරක් විය හැකි බැවිනි.
5. මිනිත්තු 6-8කට වඩා ගත වීමේදී කිරිවල ගුණාත්මක බව අඩුවන බැවිනි.

38. කුකුළු පාලනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. බ්‍රොයිලර් සතුන් සාමාන්‍යයෙන් සූක්ෂම ආකාරයට ඇති කරයි.
B. බෲඩරය තුළ පළමු සතිය තුළ $35^0C$ පමණ උෂ්ණත්වය සපයා පසුව ක්‍රමයෙන් කාමර උෂ්ණත්වය තෙක් අඩු කරනු ලැබේ.
C. ඝන අස්තරණ ක්‍රමයේදී නිවාසය තුළ 10cm පමණ ඝනකම් අතුරනුවක් පවත්වා ගත යුතුය.
D. සියලුම සතුන්ට උපතේදී මරෙක්ස් එන්නත ලබාදිය යුතුය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,
1. A, B හා C පමණි.
2. B, C හා D පමණි.
3. A, C හා D පමණි.
4. A, B හා D පමණි.
5. ඉහත සියල්ලම.

39. එක්තරා සත්ත්ව ආහාරයක දළ තන්තු ප්‍රමාණය 18%ට වැඩිය. දළ ප්‍රෝටීන 30% වැඩි ප්‍රමාණයක් ඇති මෙම ආහාරය සතා විසින් උලා කනු ලැබේ. මෙම ආහාරය විය හැක්කේ,
1. ග්ලිරිසීඩියා
2. පියුරේරියා
3. පැන්ගෝලා
4. බ්‍රැකේරියා
5. ගිනි තෘණ

40. කුකුළන්ට වැළදෙන ආසාදිත නොවන රෝගයකි,
1. පුල්ලෝරම්
2. ගම්බෝරෝ
3. කොක්සිඩියෝසිස්
4. පණු රෝග
5. කකුල් කොරවීම



AL අපි
Click & Visit Our Site
ALapiedu.com

41.එක්තරා ආයතනයක පිරිවැය ශ්‍රිතය පහත දැක්වේ.

$TC = 8000 + 160Q + 0.02Q^2$

TC = මුළු පිරිවැය

Q = නිමැවුම් ප්‍රමාණය

ඉහත ආයතනයේ මුලු විචල්‍ය පිරිවැය වන්නේ,

1. $160 + 0.02Q$
2. $160Q + 0.02Q^2$
3. $160 + 0.02Q^2$
4. $0.02Q^2$
5. $80Q + 0.01Q^2$

42. එක්තරා වෙළඳපොළ ව්‍යුහයක ලක්ෂණ පහත දැක්වේ.

A. වෙළඳපොළට පිවිසුම හා පිටවීම සඳහා බාධා තිබීම.

B. භාණ්ඩ සඳහා ආදේශක නොමැති වීම.

C. අධි ප්‍රමාණික ලාභ අඛණ්ඩව පැවතීම.

මෙම වෙළඳපොළ ව්‍යුහය විය හැක්කේ,

1. පූර්ණ තරගකාරි වෙළඳපොළ
2. ඒකාධිකාරි වෙළඳපොළ
3. කතිපයාධිකාරි වෙළඳපොළ
4. ඒකාධිකාරි තරග වෙළඳපොළ
5. ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපොළ

43. නිෂ්පාදන ආර්ථික විද්‍යාවේදී භාවිත වන විවිධ නිෂ්පාදන සම්බන්ධතා සහ ඒ එක් එක් සම්බන්ධතාවයේදී භාවිත වන වක්‍ර නිවැරදිව දක්වා ඇත්තේ,

1. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව - සම නිෂ්පාදන වක්‍රය හා සම පිරිවැය වක්‍රය
2. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව -නිෂ්පාදන හැකියා වක්‍රය හා සම පිරිවැය වක්‍රය
3. යෙදවුම් - යෙදවුම් සම්බන්ධතාව - නිෂ්පාදන හැකියා වක්‍රය හා සම ආදායම් වක්‍රය
4. නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාව - සම නිෂ්පාදන වක්‍රය හා සම පිරිවැය වක්‍රය
5. නිමැවුම් - නිමැවුම් සම්බන්ධතාව - නිෂ්පාදන හැකියා වක්‍රය හා සම පිරිවැය වක්‍රය

44. පහත දී ඇති ඉල්ලුම් වක්‍ර අතරින් කෘෂිකාර්මික භාණ්ඩ සඳහා අදාළ වන ප්‍රස්ථාරය තෝරන්න.

1.



2.



3.



4.



5.



45. රජය මගින් වී සඳහා වෙළඳපොළ සහතික මිලක් පැනවීමට නිසා ඇතිවිය හැකි තත්වයක් නොවන්නේ,

1. වෙළඳපොළ තුළ වී අධි සැපයුමක් ඇති වීම.
2. රජය විසින් වී තොග රැස් කිරීම.
3. වෙළඳපොළ සහල් මිල ඉහළ යාම.
4. වී නිෂ්පාදකයින්ට සාධාරණයක් ඉටු වීම.
5. මෝල් හිමියන්ට අඩු මිලකට වී මිලදී ගත හැකි වීම.



Click & Visit Our Site
ALapiedu.com

46. ජෛව ගතික ගොවිතැනේදී යොදා ගන්නා මූලධර්මයක් නොවන්නේ,
1. ශාක විවිධත්වය
2. සත්ත්ව විවිධත්වය
3. හෝමියෝපති ද්‍රාවණ
4. ජෛව බලය
5. අවශ්‍යතාවයට පමණක් රසායනික පොහොර භාවිතය.

47. කඩින් කඩ බෝග වගාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A. එක් බෝගයක වර්ධන අවධිය අවසන් වීමට පෙර තවත් බෝගයක් ක්ෂේත්‍රයේ සංස්ථාපනය කරයි.
B. වර්ෂයකට බෝග වගා කරන වාර ගණන වැඩි වේ.
C. අතුරු යත් ගැම හා අස්වනු නෙළීම වඩාත් පහසුය.
මින් සත්‍ය වන්නේ,
1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A හා B පමණි.
5. B හා C පමණි.

48. කෘෂිකර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් අතර දක්නට ලැබෙන රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. විජලනය
B. අධ්‍යාතතිය
C. අභිස්පන්දනය
D. කරකැවිල්ල හා ක්ලාන්තය
E. නීල වර්ණතාව
මින් අධික උෂ්ණත්වය සහිත ස්ථානයක කෘෂිකාර්මික කටයුතුවල නිරත වීම නිසා ඇති විය හැකි තත්ත්ව වන්නේ,
1. A,B,C
2. B,C,D
3. C,D,E
4. A,D,E
5. B,D,E

49. දේශගුණික විපර්යාස පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය වන්නේ,
1. මේ සඳහා ස්වභාවික ක්‍රියාදාම හා මිනිසාගේ ක්‍රියාකාරකම් දායක වේ.
2. ස්වභාවික හරිතාගාර ආවරණයද මෙයට ප්‍රධාන හේතුවකි
3. ගෝලීය උෂ්ණත්වය ඉහල යාම මෙහි ප්‍රධාන ලක්ෂණයකි.
4. මෙය ජල චක්‍රයේ අසමතුලිතතා ඇති කිරීම නිසා දීර්ඝ නියං, අධිත්‍රීව වැසි ආදිය ඇති වේ.
5. පොසිල ඉන්ධන දහනය, වන හරණය, කාර්මීකරණය වැනි කරුණු ද දේශගුණික විපර්යාස ඇති වීමට බලපායි.

50. ජාන සම්පත් විනාශ වීම කෙරෙහි බලපාන සාධක අතුරින් මිනිස් ක්‍රියාකාරකම්වල අවම දායකත්වයක් පෙන්නුම් කරනුයේ,
1. ජීවීන් සඳහා පවතින වාසස්ථාන වෙනස් කිරීමෙනි.
2. පරිසරයට ආගන්තුක ජීවීන් හඳුන්වා දීමෙනි.
3. භූමිකම්පා ඇති වීමෙනි.
4. ජාන සම්පත් වෙළඳාම මගිනි.
5. පරිසරය දූෂණය මගිනි.



AL අපි
Click & Visit Our Site
ALapiedu.com